# මනසේ ප්‍රධානත්වය

පැවැත්ම යන්න නිර්වචනය කිරම පහසු නැත. ඇත්තට ම පැවැත්ම යන්න නිර්වචනය කළ නොහැකි යැයි කීමට සිදු වෙයි. එයට හේතුව හුදු ඉන්ද්‍රිය ගෝචර වීම හෝ නො වීම හෝ පැවැත්මේ දී වැදගත් නො වීම ය. ඉන්ද්‍රිය ගෝචර නො වූ ගුරුත්වාකර්ෂණය ඇතැ යි හෙවත් පවතින්නේ යැයි කියන්නන් ඉන්ද්‍රිය ගෝචර වන මිරිඟුව නැතැ යි කියන්නේ කෙසේ ද? ඒ ළඟට ගොස් බැලූ කල මිරිඟුව නො තිබෙන හෙයින් ද? එසේ නම් ඇතැ යි කියන්නේ කෙතරම් සමීපයෙන් සිට බැලූ කල පෙනෙන දැ ද? දුරේක්ෂයෙන් බැලූ කළ පෙනෙන දැ ඇතැ යි අපි ගනිමු ද? ඈත පෙනෙන ග්‍රහවස්තුවක් සමීපයට ගිය විට එය නො පෙනී නොයන්නේ යැයි අප දන්නේ කෙසේ ද? සමීපයට ගිය විට මිරිඟුව නොපෙනී යන්නේ නම් සමීපයට ගිය විට ග්‍රහවස්තුව ද නොපෙනී යා හැකි ද? නැති පැවැත්මක් නිර්වචනය කළ හැකි ද?

අන්වීක්ෂයෙන් බැලූ කල පෙනෙන දැ පවතින්නේ ද? අන්වීක්ෂයෙන් බැලූ කල වර්තනයේ දී හෝ පරාවර්තනයේ දී හෝ ඒ දෙකෙහි දී ම හෝ සිදුවන දේ සිදු වී අපට යම්කිසි නැති ප්‍රතිබිම්බයක් පෙනෙන්නට සලස්වන්නේ ද? තල දර්පණයෙන් පෙනන ප්‍රතිබිම්බ නොමැති නම් තාත්ත්වික යැයි කියන ප්‍රතිබිම්බ ද ස්පර්ශ කළ නොහැකි නම් අන්වීක්ෂයෙන් හෝ දුරේක්ෂයෙන් පෙනන දැ ඇතැ යි අප කියන්නේ කෙසේ ද? අප පිළිගත යුත්තේ ස්පර්ශ කළ හැකි දැ පමණක් පවතින බව ද? එවිට නිසල වාතය තිබේ යැයි, පවතින්නේ යැයි අපි කියමු ද? සුළඟක් පවතින අවස්ථාවක වාතය අපේ ශරරයේ ස්පර්ශවන බව දැනෙන මුත් අපට සාපේක්ෂ ව නිසල ව ඇති වාතය දැනගත හැකි ඉන්ද්‍රියයක් අප සතු වේ ද?

ඉතා පැහැදිලිව ඉන්ද්‍රිය ගෝචර වීම හෝ නො වීම හෝ පැවැත්ම තීරණය කරන නිර්ණායකයක් නො වෙයි. අපට යමක් නිරපේක්ෂ ව හෝ වාස්තවික ව හෝ පවතින්නේ යැයි කිව හැකි ක්‍රමයක් නැත. එනම් ඒ සඳහා නිර්ණායකයක් සූත්‍රගත කරගත නොහැකි ය. අපට ප්‍රකාශ කළ හැක්කේ ඉන්ද්‍රිය ගෝචර දැ මෙන් ම ඉන්ද්‍රිය ගෝචර නො වන දැ ද පවතින්නේ යැයි කීමට අපට නොහැකි බව ය. ඉන්ද්‍රිය ගෝචර දැ ගැන කරන කතා බහේ දී අප අමතක කරන කරුණක් වෙයි. එනම් මේ සියල්ල ග්‍රහණය කර ගැනීමේ දී මනස ද බලපාන බව ය. මනස නොමැති ව ඉන්ද්‍රිය ගෝචර වන දැ ගැන කතා කළ හැකි නො වෙයි.

බටහිරයෝ මනස ඉන්ද්‍රියක් ලෙස නො පිළිගනිති. මනස පිළිබඳ ව ඔවුනට භාරතීයයනට හා සිංහලයනට පමණ දැනුමක් නැත. මෙරට බොරු මනෝ විශ්ලේෂකයන් ෆ්‍රොයිඩ් ලකාන් ආදී බටහිර මනෝ විශ්ලේෂකයන් පසුපස ගිය ද ඔවුනට මනස යනු කුමක් දැයි කිව හැකි ද? මනස ඇති වන්නේ ද්‍රව්‍ය නිසා යැයි යම් අයකු කිව හොත් අපට අසන්නට ඇත්තේ මනසෙන් තොර ව ද්‍රව්‍යය ඇති බව මනසෙන් තොර ව පෙන්වා දිය හැකි ද යන්න පමණකි. අපට කිසි ම දෙයක් මනසින් තොර ව ග්‍රහණය කරගත නොහැකි ය. එසේ නම් ඒ තිබෙන්නේ යැයි කියන දේ මනස ද නිසා ඇති වන්නක් යැයි අපට කිව හැකි ද?

අප ඉන්ද්‍රිය ගෝචර දැ ලෙස ගන්නා සියල්ල හුදු ඉන්ද්‍රිය ගෝචර දැ නො වෙයි. මෙහි දී ඉන්ද්‍රිය යන්නට මනස ගෙන නොමැති බව කිව යුතු ය. බටහිරයෝ මනස ඉන්ද්‍රියක් ලෙස නො ගනිති. සාමාන්‍යයෙන් ඉන්ද්‍රිය ගෝචර යැයි කීමේ දී මනසේ ක්‍රියාකාරත්වය නොසලකා හැරෙයි. එහි දී ඉන්ද්‍රිය යනුවෙන් සැලකෙන්නේ මනස හැරෙන්නට ඇති පංචේන්ද්‍රිය ය. එහෙත් මේ ක්‍රියාවලියේ දී අපට මනස නොසලකා සිටිය හැකි නො වෙයි. මනස නොමැති ව අපට කිසිවක් ගෝචර නො වෙයි.

අප මෙහි දී අවසාන වශයෙන් ගත් කල කරන්නේ සත්බව හා ඥානවිභාගය (දැනුම පිළිබඳ ප්‍රවාදය) තේරුම් ගැනීම ය. එය ද දැනුමකි. බටහිරයන් සත්බව හා ඥානවිභාගය එකිනෙකින් වෙන් කළ ද, භාරතීයයෝ හා සිංහලයෝ එසේ නො කළ හ. භාරතීයයන්ට හා සිංහලයන්ට සත්බව හා ඥානවිභාගය එකිනෙකින් වෙන් වූ දැ නො වෙයි. පැවැත්ම ඒ පිළිබඳ දැනුමෙන් වෙන් කරන්නේ කෙසේ ද?

© Prof. Nalin De Silva

දැනුම සම්බන්ධ ප්‍රශ්නවල දී අප කළ යුත්තේ කුමක් ද? එහි දී බලපැවැත්විය යුතු නිර්ණායක ලෙස අප තීරණය කරන්නේ කිනම් දෑ ද? එහි උපකල්පන කවරක් විය යුතු ද? මෙවැනි ප්‍රශ්නවල කෙළවරක් තිබිය හැකි ද? මනසක් නැති අයකුට තිබිය හැකි දැනුම කුමක් ද? කැමරාවේ කාචය ඔස්සේ එයට අලෝක ධාරා ලැබෙයි. ඒ ආලෝක ධාරා සේයාපටයක සටහන් කරගැනීමට ද සැලැස්විය හැකි ය. එහෙත් කැමරාවට ඒ පිළිබඳ දැනුමක් වේ ද? කැමරාවට අප ආලෝකය යැයි කියන දෑ ඇතුළු වුව ද මනසක් නොමැති කැමරාව ඒ කිසිවක් නො දනියි.

මනසින් තොර ව දැනුමක් නැතැ යි අපි කියමු. දැනුම ලබාගැනීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන්නේ මනස විසිනි. බෞද්ධයෝ මනස සියල්ලට ප්‍රධාන ලෙස සලකති. සියලු ධර්ම අතරින් ප්‍රධාන වන්නේ මනස ය. එසේ නම් ඇසිය හැකි ප්‍රධාන ප්‍රශ්නය වනුයේ මනස යනුවෙන් දෙයක් පවතින්නේ ද යන්න ය. අනෙක් දෑ කෙසේ වෙතත් මනස පවතින්නේ ද යන ප්‍රශ්නය කාහටත් වැදගත් වෙයි. විඥානවාදී යැයි ගැනෙන දාර්ශනික ධාරාවට අනුව මනස පවතියි. අනෙක් දෑ මනසෙහි නිර්මාණ වෙයි.

එහෙත්, බෞද්ධයනට මනස පවතින්නේ යැයි ගැනීමට නොහැකි ය. මනස පවතින්නේ යැයි ගත් කල මිනිසකු යනුවෙන් සත්ත්වයකු පවතින්නේ යැයි ගැනීමට සිදු වෙයි. වෙනත් වචනවලින් කිව හොත් ආත්මයක් ඇතැයි පිළිගැනීමට සිදු වෙයි. බෞද්ධයනට එසේ කළ හැකි නො වෙයි. මනස යනුවෙන් දෙයක් වාස්තවික ව පැවතීම බෞද්ධයනට ප්‍රශ්නයකි. එබැවින් අපට කළ හැක්කේ මනස ද වාස්තවික ව නොපවතින්නක් ලෙස ගැනීම ය. මනස වස්තවික ව නොපවතින්නේ නම් මනසට ද ඇත්තේ සාපේක්ෂ පැවැත්මකි. මනස සාපේක්ෂ විය හැක්කේ කුමකට ද? මනස සාපේක්ෂ වන වෙනත් වස්තුවක් ගැනීම යනු ඒ වස්තුවට යම් වාස්තවිකත්වයක් ලබා දීම ය. ඒ කළ හැකි වුවක් නො වෙයි. එබැවින් කළ හැකි දේ වනුයේ මනස මනසට ම සාපේක්ෂ ලෙස ගැනීම ය.

බෞද්ධයෝ මධ්‍යම ප්‍රතිපදාවක් ගැන කතා කරති. මේ මධ්‍යම ප්‍රතිපදාව සම්බන්ධයෙන් විවිධ පුද්ගලයෝ විවිධ දෑ කතා කරති. මධ්‍යම ප්‍රතිපදාව යනු ඇතැමුන්ට අන්තයකට නො යෑම ය. එහෙත් අන්තයකට නො යෑම යනුවෙන් කියැවෙන්නේ ඒ අන්ත දෙකෙහි මැද ගැනීමක් ද? මධ්‍යම ප්‍රතිපදාව යනු මැද ගැනීම වැනි අදහසක් ඇතැම් බෞද්ධයනට ඇති වී තිබෙන්නේ සිදුහත් තවුසානන් කාම සුඛල්ලිකානුයෝගය මෙන් ම අත්ථකිලමතානුයෝගය ද අත්හැරමේ දී ඒ දෙක ම නො වන මැද පිළිවෙතක් අනුගමනය කළ බැවින් යැයි සිතිය හැකි ය.

නො කා නො බී දුෂ්කර ක්‍රියා කිරම මෙන් ම ඉතා සුඛොපභෝගී ව ජීවත් වීම ද අත්හැරමේ දී යමක් කා බී ජීවත් විය යුතු බව සැබෑ ය. එහෙත් වස්තුවක පැවැත්ම ගැන කතා කිරමේ දී මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරම යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? උච්ඡේදවාදය හා ශාස්වතවාදය යනුවෙන් හැඳින්වෙන දෘෂ්ටි ප්‍රතික්ෂේප කිරමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය කුමක් ද? බෞද්ධ ධර්මයෙහි මධ්‍යම ප්‍රතිපදාව යනුවෙන් කියැවෙන්නේ ශාස්වතවාදය මෙන් ම උච්ජෙදවාදය ද අත්හැරම ය.

එහෙත් එසේ අත්හැරම යනු ඒ දෙකේ මැද තැනකට පැමිණීම නො වෙයි. අත්ථකිලමතානුයෝගය හා කාමසුඛල්ලිකානුයෝගය සම්බන්ධයෙන් ගත් කල එවැනි මැදකට පැමිණිය හැකි වුව ද ශාස්වතවාදය හා උච්ජෙදවාදය සම්බන්ධයෙන් ගැනීමේ දී එවැනි මැදකට පැමිණිය හැකි නො වෙයි. ශාස්වතවාදය හා උච්ඡෙදවාදය ගැන බොහෝ විට කතා කෙරන්නේ මරණින් පසු කුමක් සිදු වන්නේ ද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ය. ශාස්වතවාදයට අනුව මරණින් පසු ද දිගින් දිගට ම පවතින ආත්මයක් වෙයි. මරණය නිසා ආත්මයේ පැවැත්මට කිසිවක් නො සිදු වෙයි. ආත්මය දිගින් දිගට ම පවතියි.

උච්ඡෙදවායෙහි දී සියල්ල මරණින් කෙළවර වෙයි. මරණින් පසු දිගින් දිගට පවත්නා යමක් නැත. සදාකාලික ආත්මයක්, බ්‍රහ්මන් වැන්නක් (එකිනෙකා ගේ ආත්ම ද බ්‍රහ්මන් ම වන බව අමතක නො කළ යුතු ය. අපේ ආත්ම යනුවෙන් අප ගන්නේ මායාව හේතුවෙන් බ්‍රහ්මන් ගෙන් වෙන් වී සිතන බැවින් ය.) පැවතීමට උච්ඡෙදවාදයෙන් ඉඩක් නැත. එහෙත් ප්‍රශ්නයක් වෙයි. මරණයට පළමු යමක් පැවතියේ ද? සියල්ල මරණින් කෙළවර වන්නේ පැවති යමක් මරණයට පසුව නැති වී යාම නිසා ද?

© Prof. Nalin De Silva

උච්ඡේදවාදය ද ශාස්වතවාදය මෙන් ම පැවැත්මක් ගැන සඳහන් කරන බව පැහැදිලි ය. දිගින් දිගට පවත්නා ආත්මයක් වැන්නක් උච්ඡේදවාදයේ දී බැහැර කෙරුණ ද, මරණය තෙක් හෝ යමක් පවතින බව එහි දී ද උපකල්පනය කෙරෙයි. සාමාන්‍යයෙන් ගත් කල උච්ඡේදවාදීහු ලොකායතවාදීහු වූ හ. ඔවුහු යළි ඉපදීමක් හෝ පුනර්භවයක් ගැන විශ්වාස නො කළ හ. ඔවුනට අනුව සියල්ල මරණයෙන් කෙළවර විය. එහෙත් මරණයෙන් කෙළවර වීමට ද යමක් පැවතිය යුතු විය. උච්ඡේදවාදයේ දී එසේ යමක් පැවතී මරණයත් සමග ඒ විනාශ වී නැති වී යයි.

බුදුන්වහන්සේ ශාස්වතවාදීන් මෙන් මරණින් පසු ද දිගින් දිගට ම පවත්නා ආත්මයක් ගැන නො දෙසූ හ. එමෙන් ම උන්හන්සේ සියල්ල මරණයෙන් කෙළවර වන බවක් ද නො දෙසූ හ. උන්වහන්සේ ඒ අන්ත දෙක ම ප්‍රතික්ෂේප කළ හ. එහෙත් උන්වහන්සේ පුනරුත්පත්තිය හෙවත් නැවත ඉපදීම ප්‍රතික්ෂේප නො කළ හ. ඇතැම් උගත් බෞද්ධයන් මේ ප්‍රකාශයට විරුද්ධ වනු ඇත. ඔවුනට අනුව පුනරුත්පත්තියක් නැත. එයට හේතුව පුනරුත්පත්තිය හෙවත් නැවත ඉපදීම යැයි කියන විට ඉන් ආත්මයක් ගැන උපකල්පනය වීම යැයි මේ උගත් බෞද්ධයෝ පවසති. එබැවින් ඉන් ගැලවීම සඳහා ඔවුහු පුනබ්භවය යන්න යොදාගනිති.

පුනබ්භවය යන්නෙන් ආත්මය යන සංකල්පය ඉවත් වන්නේ ද? තවත් භවයක් ඇත්තේ කා හට ද යන ප්‍රශ්නයට මේ උගත් බෞද්ධයන් දෙන පිළිතුර කුමක් ද? නැවත ඉපදෙන්නේ කවුද යන ප්‍රශ්නයට වඩා වෙනසක් ඒ ප්‍රශ්නයෙහි නැත. තවත් භවයක් ලබන්නේ කවුද? එයට පිළිතුර ලෙස මිලින්ද ප්‍රශ්නයෙහි දැක්වෙන අයුරින් තමාත් නො වේ ය, අන් අයකුත් නො වේ යැයි පිළිතුරු දිය හැකි වුව ද, ඒ පිළිතුර ම නැවත උපදින්නේ කවුද යන ප්‍රශ්නයට ද දිය හැකි ය. මෙහි දී ප්‍රශ්නය වනුයේ එසේ යළි ඉපදෙන තුරු හෝ වෙනත් භවයක් ලබන තුරු මේ භවයෙහි යමකු පවතින්නේ ද යන්න ය. බුදුන් වහන්සේ ඒ ප්‍රශ්නයට දුන් පිළිතුර ලෝක ඉතිහාසයෙහි දී ඇති වැදගත් ම පිළිතුර වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva